// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2394/66 - 2024 ජූලි මස 26 වැනි සිකුරාදා - 2024.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021(III)

### 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 44 වන වගන්තිය සමග කියවිය යුතු, ඒ පනතේ 71 වන වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විමසා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා වශයෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

#### නියෝග

1. මේ නියෝග 2024 අංක 05 දරන කොළඹ වරාය නගරය (අක්වෙරළ බැංකු-විචක්ෂණශීලී කළමනාකරණය සහ විශ්වසනීයත්වය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග, පනත යටතේ යම් බලයලත් තැනැත්තකු විසින් කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

3. ශ්‍රී ලංකා මහ බැංකුව පනත යටතේ වන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් වන එකම නියාමන අධිකාරිය වන මහ බැංකුව, කොළඹ වරාය නගරය ශාඛාව අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු වන අතර, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සම්බන්ධයෙන්, කොමිෂන් සභාව වෙත දැනුම් දී, එම කොළඹ වරාය නගරය ශාඛාව වෙත මෙහෙයුම් උපදෙස්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ නිකුත් කිරීමට එයට බලය තිබිය යුතු ය. කොළඹ වරාය නගරය ශාඛාව නියාමනය සහ අධීක්ෂණය සිදු කිරීමේ දී මහ බැංකුව විසින්, ප්‍රායෝගිකව හැකි තාක් දුරට, බැංකු අධීක්ෂණය සම්බන්ධයෙන් වන බාසල් කමිටුව විසින් මෙන්ම වෙනත් සමාන ප්‍රමිතීන් නියම කිරීමේ ආයතන විසින් නිකුත් කර ඇති මූලධර්ම, මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සැලකිල්ලට ගත යුතු ය.

1A - PG 6792 — 364 (2024/07)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. කොළඹ වරාය නගරය ශාඛාව විසින් පනතේ VIII වන කොටස යටතේ කලින් කලට අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගවලට සහ කලින් කලට මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස්වලට, මාර්ගෝපදේශවලට සහ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

5. සෑම කොළඹ වරාය නගරය ශාඛාවක් ම විසින්, නිර්වාසික තැනැත්තන් සමග නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් පමණක් බැංකු ව්‍යාපාර කටයුතු සිදු කළ යුතු ය. එවැනි ගනුදෙනු ශ්‍රී ලංකාවේ වාසික තැනැත්තන් සමග සිදුකරනු ලබන අවස්ථාවක දී, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ කාර්ය සඳහා මහ බැංකුවෙන් සාමාන්‍ය හෝ විශේෂිත බලයදීමක් ලබා ගත යුතු ය.

6. (1) අක්වෙරළ බැංකු මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට එරෙහි වීම පිළිබඳ ව්‍යවස්ථාපිත නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටින බැවින්, මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට ඕනෑම කොළඹ වරාය නගරය ශාඛාවක් සම්බන්ධයෙන් අධිකාරී බලයක් තිබිය යුතු ය.

(2) 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ පනතේ, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතේ සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධානවල සහ ඒවා යටතේ සාදන ලද යම් නියෝගවල, රීතිවල සහ විධානවල නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කිරීම කොළඹ වරාය නගරය ශාඛාවේ කාර්යය විය යුතු ය.

7. කොළඹ වරාය නගරය ශාඛාවක ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය වෙනස් කරනු ලබන හෝ එයට වෙනත් අධිකාරියක් අනුප්‍රාප්ත වන හෝ නීතියෙන් අවලංගු කරනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනස් කිරීම, අනුප්‍රාප්ත වීම හෝ අවලංගු කිරීම සිදුවීමෙන් කැලැන්ඩර දින 14ක් ඇතුළත ඒ කාරණය පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දීම ඒ කොළඹ වරාය නගරය ශාඛාවේ කාර්යය විය යුතු ය.

8. අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා කොළඹ වරාය නගරය ශාඛාව විසින් ගෙවිය යුතු ගාස්තු, අයබදු, අධිභාර සහ දඩ මුදල් පිළිබඳව කොමිෂන් සභාව විසින් ස්වකීය වෙබ් අඩවියෙහි පළකරනු ලැබිය යුතු අතර, ඒවා නිශ්චිතව දක්වනු ලබන දිනයක සිට බලාත්මක විය යුතු ය.

9. යම් කොළඹ වරාය නගරය ශාඛාවක කාර්ය සහ කර්තව්‍ය ඉටුකිරීම සහ එම ශාඛාවේ ගනුදෙනු කරගෙන යාම පැවරී ඇති හෝ ඒ සඳහා බලය දී ඇති එම ශාඛාවේ සේවානියුක්තිකයකුට, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශයෙන් පිටත ක්‍රියාත්මක වන, එම බැංකුවේ ප්‍රධාන කාර්යාලයට, යම් ශාඛාවකට හෝ මෙහෙයුම් ඒකකයකට අදාළ කිසිදු කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටුකිරීමට හෝ කිරීමට හෝ කිසිදු ගනුදෙනුවක් සිදුකිරීමට බලය හෝ අවසරය නොතිබිය යුතුය.

එසේ වුවද, කොළඹ වරාය නගරය ශාඛාව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශාඛාවක් වන විට දී, අවස්ථාවෝචිත පරිදි, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ එම බැංකු ශාඛාව ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති අවස්ථාවක දී එහි ප්‍රධාන කාර්යාලය විසින් පත් කරනු ලබන හෝ සේවානියුක්ත කරනු ලබන කළමනාකරණ කමිටුව හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින්, පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද නියෝගවලට අනුකූලව එම බැංකුවේ කොළඹ වරාය නගරය ශාඛාවේ පරිපාලනය, කළමනාකරණය, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් විධායක අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

එසේම තවදුරටත්, කොළඹ වරාය නගරය ශාඛාව සම්බන්ධයෙන් විධායක අධිකාරී බලය ක්‍රියාත්මක කරන හෝ අධීක්ෂණය කරන කිසිදු අධ්‍යක්ෂවරයකු, කළමනාකරණ කමිටුවක සාමාජිකයකු හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් එම කොළඹ වරාය නගරය ශාඛාව වෙතින් සෘජුවම හෝ වක්‍රව, කිසිදු පාරිශ්‍රමිකයක් හෝ සේවානියුක්තිය ආශ්‍රිත ප්‍රතිලාභයක් ලබා නොගත යුතු ය.

10. කොළඹ වරාය නගරය ශාඛාව වෙත සම්බාධක පනවනු ලබන, දඩ නියම කරනු ලබන, අනතුරු හඟවනු ලබන හෝ ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය විසින් නිකුත් කරන ලද නියාමන අවශ්‍යතාවලට අනුකූලව කටයුතු නොකරන බව හඳුනාගනු ලබන අවස්ථාවක දී හෝ, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා එම කොළඹ වරාය නගරය ශාඛාව වෙත නිකුත් කර ඇති අවසරය එම ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය විසින් අත්හිටුවනු ලබන, ආපසු ගනු ලබන, අවලංගු කරනු ලබන, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන හෝ එම අවසරය අතහරිනු ලබන අවස්ථාවක දී, එම නියාමන ක්‍රියාමාර්ගය සිදු වූ දින සිට කැලැන්ඩර් දින දාහතරක් ඇතුළත ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම්දීම එම කොළඹ වරාය නගරය ශාඛාවේ කාර්යය විය යුතු ය. කොමිෂන් සභාව විසින් එම තොරතුරු, අවස්ථාවෝචිත පරිදි, මහ බැංකුව හෝ ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සමග හුවමාරු කරගනු ලැබිය යුතු ය.

11. මේ නියෝගවල -

"පනත" යන්නෙන්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අදහස් වේ;

"ශාඛාව" යන්නෙන්, යම් සමාගමක මූලස්ථාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය හෝ හැර ව්‍යාපාර කටයුතු කරගෙන යන ස්ථානයක් අදහස් වේ;

"මහ බැංකුව" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"කොළඹ වරාය නගරය ශාඛාව" යන්නෙන්, පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ හෝ එහි සිට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරතවීම සඳහා බලපත්‍රලාභී සමාගමක ශාඛාවක් අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, පනත යටතේ පිහිටුවන ලද කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව අදහස් වේ;

"නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ, මහ බැංකුව විසින් "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යනුවෙන් නිශ්චය කරන ලද විදේශ ව්‍යවහාර මුදලක් අදහස් වේ;

"මූල්‍ය ආයතන" යන්නට, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය" යන්නට, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රභව දේශයේ නියාමන අධිකාරිය" යන්නෙන්, අදාළ බැංකුවේ කොළඹ වරාය නගරය ශාඛාවේ මව් අස්ථිත්‍යය පිහිටුවා ඇති රටේ බැංකු ක්ෂේත්‍ර නියාමන අධිකාරිය අදහස් වේ;

"අක්වෙරළ බැංකු ව්‍යාපාරය" යන්නට, පනතේ දක්වා ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මව් අස්ථිත්‍යය" යන්නෙන්, පනත යටතේ කොළඹ වරාය නගරය ශාඛාවට අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතුවල නිරත වීම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට සුදුසුකම් ලබා දෙන බැංකු බලපත්‍රය දරන අස්ථිත්‍යය අදහස් වේ; සහ

"වාසික තැනැත්තා" සහ "නිර්වාසික තැනැත්තා" යන්නට, පනතේ දක්වා ඇති අර්ථයම තිබිය යුතු ය.

EOG 07 - 0270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.